34 වන පිටුවට

ලොකු නිසා.

ඒත් මනාලිට බොම්බයි මොටයි කන්න උනේ නෑ. ඈ බොම්බයි මොටයි කූර ටික කලක් යනකං කන කසන්න ගත්ත.

මංගල පෙරහැර විවාහ ලේකම් කාර්යාලෙ කිට්ටුවට එනකොට මනාලිගෙ හිත හොඳටම කලබල වෙලා, බයවෙලා තිබ්බෙ. ඈට ඕනෙ වෙලා තිබ්බෙ මනාලයාගේ අතේ එල්ලෙන්ට. ඈ දැන උන්න එතකොට එයා ඇගෙ ඇඟ වටේ අත යවලා තමන්ව තුරුල් කර ගන්න බව. එතකොට ඇදවැටෙයි කියල බය නැත්තටම නැති වෙන බව ඈ දැන උන්න. මනාලයට ඕනෙ වුනෙත් ඒ දේමයි. දෙන්නට දෙන්න එහෙම ලං වෙලා උන්න නම් ඇදවැටෙයි කියල තියෙන බය නැති වෙනව. ඒත් එතන එහෙම කරන්න පුළුවන් තැනක් වුණේ නෑ.

★★★★★★★★★★★★★

විවාහ ලේකම් කාර්යාලයෙන් මහ මගට පිළිපන් ඔවුහු චුම්බනයක් පිළිබඳ ශේෂ වූ බලාපොරොත්තුවකිනිදු තොරවම වෙන් වූයේ ය. මනාලියගේ මව, පියා සහ සොයුරා කුඩා අවන් හල තුලට ඇතුළු පසු ඇය සහ ඔහු මගී ආවරණය යට තනි වූවෝය.

ඔවුහු කිසිත් නොදෙඩූහ. එනමුත් දහසකුත් එකක් ප්‍රාර්ථනාවෝ උන්ගේ හදවත් තුල කඳු ගැසුණෝය.

එකල ඒ අශ්‍රද්ධාන පාලක තෙම අධර්මයෙන්, මර්දනයෙන් රාජ්‍ය විචාරන්නේ ජන පදිකයෝ බඩ සායෙන් පෙලෙන්නාහු, රෝ බියෙන් පෙළෙන්නාහු, ඉච්ඡාභංගත්වයෙන් හා අසහනයෙන් දවස් හරින්නාහු ය.

එකල් හී උකටලී නොවූ එක් මනුෂ්‍යයෙක්, දකුණු දිග්භාගයෙහි වාහල්කඩ අස නියම්ග ම් මධ්‍යට වැද බොහෝ ජනයා වෙත ගොස්, "තෙල ජනයිනි! පාලකයා අධර්මිෂ්ඨ හෙයින් අපගේ ජීවිත රක්ෂා නැත්තාහු, සමෘද්ධිමත් නැත්තාහු. පාලකයා අශ්‍රද්ධාන හෙයින් අප ඔබ සායෙන් පෙළෙන්නාහු, රෝ බියෙන් පෙළෙන්නාහු......"

එකල ඒ අධර්මිෂ්ඨ පාලක තෙමේ, සාරි ගෙවල් පිළිසකර කරවාලා, දඟ ගෙවල් වඩ ගෙවල් තනවාලා, දංගෙඩි පිළිසකර කරවාලා, නුවර දස දිග්භාගයෙහිම වදමල්, රත්මල් රෝපණය කරවාලා.....

ඔවුහූ ඒ මගී ආවරණය යට මුවින් නොබැණ, පැතූ ප්‍රාර්ථනාවෝ දහසකුත් එකක් වී නමුදු, එයින් සඵල වන එක් ප්‍රාර්ථනාවක් විනියේ නම් ඒ අධර්මිෂ්ඨ පාලක තෙම සදාකාලික ඇඳිරි නීතිය පනවත්වා යන ප්‍රාර්ථනය පමණි.

එවිට ඔවුනට සදාකල් ඒ මගී ආවරණය යට නවාතැන් ගත හැකිවනු ඇත. නැවත හමුවන දිනයක් නිශ්චිතව නොදැන, විවාපත් වූ දිනයේම වෙන්ව යාමට සිදු නොවනු ඇත.

සිහිනයන්ට පරිමාවක්, හැඩක්, සුවඳක් හෝ ගඳක්, පිළිවෙල හෝ අරමුණ නොවන බව මට කීවේ ඔබ නිසා, මා ලියූ මේ අකුරු වැල් මා දුටු සිහිනයට ඔබ ලියූ පූර්විකාවෙහි ද්විතීය භාගය වන්නේය.

**මංගල පෙරහැර විවාහ ලේකම් කාර්යාලෙ කිට්ටුවට එනකොට මනාලිගෙ හිත හොඳටම කලබල වෙලා, බයවෙලා තිබ්බෙ. ඈට ඕනෙ වෙලා තිබ්බෙ මනාලයාගේ අතේ එල්ලෙන්ට. ඈ දැන උන්න එතකොට එයා ඇගෙඇඟ වටේ අත යවලා තමන්ව තුරුල් කර ගන්න බව. එතකොට ඇදවැටෙයි කියල බය නැත්තටම නැති වෙන බව ඈ දැන උන්න. මනාලයට ඕනෙ වුනෙත් ඒ දේමයි. දෙන්නට දෙන්න එහෙම ලං වෙලා උන්න නම් ඇදවැටෙයි කියල තියෙන බය නැති වෙනව. ඒත් එතන එහෙම කරන්න පුළුවන් තැනක් වුණේ නෑ.**

★★★★★★★★★★★★

ඒ විවාහයෙන් තෙමසක් ගත වූයේ වී නමුදු, ඔහු පැමිණියේ නැත. පරණ පුරුදු ලෙස ඔහු වෙතින් තිළිණ වන ලිපියක් රැගෙන පැමිණෙන තැපැල්කරු ගේ හඬ මිස, ඔහුගේ පා හඬ ඇයට නෑසිනි. එනමුත් ඈ නයන යුග්මයෙන් මුදාහල බලාපොරොත්තුවේ සහන් රැස් දහර වඩ වඩාත් ශෝභමාන වූයේය. වඩ වඩාත් තීව්‍රතර වූයේය.

මැයි ගස සත් වරක් මල් දරා, සත් වරක් මල් සලා යන තෙක් ද, සිංහරාජ වන ස්ථරනයෙන් අක්කර සිය ගණන් පෙහෙළි වන තෙක්ද, දොළ පහර දෙපස ජලාරක්ෂක නිළධාරීන්ගෙ " සෙවණැලි පතිත වන තෙක් ද බස්ටි පැක් මත ජීවිත බිහිවද්දී ද, විපක්ෂනායක රනිල් වික්‍රමසිංහ ගමින් ගමට යද්දී ද, විමල් වීරවංශ ජ.වි.පෙ න් බිඳී ජාතික නිදහස් පෙරමුණ අටවද්දී ද, මිහින් එයාර් අහස ජයගනිද්දී ද, දුෂ්‍යන්ත් වීරමන් ඩාන්සිං ස්ටාර් වෙද්දී ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ණය පොම්ප කරද්දී ද, ඈ ඒ බලාපොරොත්තුව ස්වකීය ඇතුළු ගැබ තුල රක්ෂා කොට ගත්තී....

සඳ කැල්මෙන් බබළන තුරුපත් සිහින් සෙවණැලි රේඛා කඳු පාමුල දෙනිපෙත මත සටහන් තබද්දී, ඈ දොළ ඉවුර පෙර කල නාන තොට අසල උන්නී...

ඉනෙහි බැඳි මුගුරෙක්ද, උරෙහි එල්ලී ගත් ගිණි කඳයෙක්ද, අතෙහි රැඳි විදුලි පන්දමකින්ද සන්නද්ධ ජලාරක්ෂක බල මුල මේ නම් අහම්බයෙන් තම හිස මත පතිත භයංකර ඉරණමක්දෝයි මෝහිනිය විසින් මවනා ලද තවත් පිල්ලියක් දෝයි සිතන්නේ, තුෂ්නිම්භූතව, ගල්හීතව...

සියළු සලු පිළි උනා දමා නිරුවතින් දොළට බට මනාලි, සැහැල්ලු මට සිලිටි සිතැත්තී... දිය බුං ගසමින්....

සීතල දොළ දියෙන් ස්නානය කොටගත් ඈ මග දෙපස වන් වනමලින් හා තුරුලතා පතින් දෝත පුරවා ගත්තීය. සීතල දිය බිඳිති රැඳි ඈ නග්න සිරුර සඳකැල්මෙන් සනහනා ලදුව ගජ දත් පැහැයෙන් ශෝභමානව දිලුණෝ ය.

කුටිය තුලට වන් ඕ තොමෝ, ඉනික්බිති මල් මාලා ගොතා ස්වකීය නග්න සිරුරෙහි පළඳවා ගනිත් ගනිත් වඩ වඩා ශෝභමාන වූවාය.

යහන මත උක්කුටියෙන් හිඳ කුටියට පිවිසෙන දොරටුව දෙස එල්ලේම බලාගත් ඕ නොයිඳුල් පියයුරු වැසීගත් බුලත් දළු අතරින් උඩගු ලෙසින් ඉදිරියට එබී, කවදා හෝ ඔහු එනතෙක් පෙර මග බලා සිටින්නට විය.

★★★★★★★★★

එයින් පසු මම පිබිදුණෙමි.

මෙතෙක් කලක් මට පෙම් කළ මගේ පෙම්වතිය, ඇතැම් විට සදහටම මගේ පෙම්වතිය ලෙස සිහිනයෙන් දුටු බව සංවේග යෙන් දැනුම් දෙමි.

සීන් සිඟිති සිරිපොද යට
ඇය තේ දළු නෙලනා විට
හෙම්බිරිස්සාව හැදුණේ මටයි.


# Migration Solutions

Are you, your friend or your relative seeking solutions for....?

- Students visa issues
- Family migration(parent, spouse etc)
- Skilled Migration (Onshore and Offshore)
- Visitor visa
- Visa cancellations issues (MRT Reviews)

Honest, reliable service assured, at affordable rates.

Call: 61 3 9547 3022

MIA
Member of Migration Institute of Australia



Manoj Dodamgoda

AUSGATE
Migration Consultancy Services

Grad.Cert. (Immi. Law), BIT
Member of Migration Institute of Australia
MARN: 0854504

No. 9/61-63 Buckley Street, Noble Park, Victoria 3174, Australia
Tel: 61 3 9547 3022 Mob: 61 430 642 774 Fax: 61 3 9547 3022
Email: manoj@ausgatemig.com.au